# නිවන හා ශූන්‍යතාව

නිවන සංකල්පයක් ද යන ප්‍රශ්නයට පිළිතුරක් අවශ්‍ය වෙයි. නිවන සංකල්පයක් යැයි අපි උපකල්පනය කරමු. එවිට සංකල්පයක් ලෙස ගත්කල නිවන පුටුව, මේසය, සිරුර, ගස වැනි අනෙක් සංකල්පවලින් වෙනස් නො වෙයි. ඒ අනෙක් සංකල්ප අප තේරුම්ගන්නේ මනසින් ය. එහි දී අනෙක් ඉන්ද්‍රිය ද යොදා ගැනෙන බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. එහෙත් මනස නොමැතිව ඒ එකක් ගැන හෝ අපට අවබෝධයක් තිබිය නො හැකි ය. සංකල්පයක් වෙන අයකුගෙන් ලැබුණ ද අපි ද මනසින් ඒ සංකල්පය නිර්මානය කරගන්නෙමු. නිවන සංකල්පයක් නම් අපට අනෙක් සංකල්ප අවබෝධකරගන්නා ආකාරයට නිවන ද මනසින් අවබෝධකරගත හැකිවිය යුතු ය. එනම් අපට නිවන ද පුටුවක් වැනි දෙයක් බවට පත්වෙයි.

නිවන යනුවෙන් අප වචනයක් යොදාගත්ත ද, නිවන නාම පදයක් මෙන් වරනැගිය හැකි වුව ද, නිවන නාමයක් හෝ සංකල්පයක් හෝ ලෙස ගැනීම වැරදි යැයි සිතිය හැකි ය. බුදුන් වහන්සේ නිවන ගැන පවතින දෙයක් ලෙස කියා නැත. නිවන මෙයත් නොව අනෙකක් ද නොව යන අදහස බුදුන් වහන්සේ නිවන ගැන කර ඇති සාකච්ඡාවලින් පැහැදිලි වෙයි.  අපට කළ හැක්කේ සංසාරයෙන් එතෙරවීම ය. එහෙත් මෙහි එතෙර යන්නෙන් ඇති තැනක් නොහැඟෙයි. ගඟෙන් එතෙර යම් තැනක් ඇති ආකාරයට සංසාරයෙන් එතෙර වූ පසු වෙනත් තැනක් දක්නට නැත. සසරින් එතෙරවීම යනු හුදු භාෂා ප්‍රයෝගයක් පමණකි.

සසරින් එතෙරවීම යන්නෙන් අදහස්කරන්නේ ගඟෙන් එතෙරවීමක් වැන්නක් නොව සසර ගමන නැවැත්වීම ය. නැවත ඉපදීම නැතිකිරීම යනු සාමාන්‍ය අර්ථයෙන් ගත්කල කියැවෙන එතෙරවීමක් නොවේ. මා දන්නා තරමින් මෙලොව ඇති සියළු ආගම් මරණින් මතු ඇතිවන තත්ත්ව ගැන කතාකරන අතර මරණින් මතු විමුක්තියක් ගැන ද උගන්වයි. බුදු දහමෙහි හැර අනෙක් සියළු ආගම්වල විමුක්තිය ලබාගන්නේ මරණය නැවැත්වීමෙන් ය. ඒ ආගම්වල විමුක්තිය යනු මරණින් පසු අත්කරගන්නා සදාකාලික තත්ත්වයකි. සදාකාලික ස්වර්ගයක සැප විඳීමක් හෝ බ්‍රහ්මන් සමග ඒකාත්ම වීම වැනි තත්ත්වයකට පත්වීම හෝ විමුක්තිය වෙයි. එසේ විමුක්තිය ලැබුවෙක් අමරණීය වෙයි. ඒ තැනැත්තා නො මියෙයි.

බුදු දහමෙහි පමණක් විමුක්තිය ඇතිවන්නේ මරණය නැවැත්වීමෙන් නොව ඉපදීම නැවැත්වීමෙන් ය. බුදුන් වහන්සේ බුදුවීමෙන් පසු උදාන වාක්‍යයෙන් ප්‍රකාශ කෙළේ ඒ උන්වහන්සේගේ අවසන් ඉපදීම බව ය. බෞද්ධයන් උත්සාහ කරන්නේ නොමැරී සිටීමට නොව නූපදීමට ය. කලකට පෙර ගුණදාස අමරසේකර මහතා යළි උපන්නෙමි මැයෙන් නවකතාවක් ලිව්වේ ය. එහි ද කතානායකයා එක්තරා ආකාරයකට යළි ඉපදී යම්කිසි විමුක්තියක් ලබයි. ඉන් පැහැදිලිවන්නේ එය බෞද්ධ සංස්කෘතියක නොලියැවුණු පොතක් බව ය. ඒ මහතා පසුකලෙක කීවේ එවැනි පොත්වල ඇත්තේ මනස්පුතුන් බව ය. ඒ කෙසේ වෙතත් බෞද්ධයනට යළි ඉපදී ලබාගත හැකි විමුක්තියක් නැත.

නිවන පිළිබඳ මතුවන ප්‍රධාන ගැටළුවක් වන්නේ අපට නිවන ගැන කතාකිරීමට සිදුවීම ය. සංසාර ගමන නැවැත්වීම යන්න දිග ප්‍රකාශයකි. එය නිතර ම කීම අපහසු ය. එබැවින් සංසාර ගමන නැවැත්වීම නිවන් දැකීම ලෙසත් නිවන් යෑමක් ලෙසත් අපි දකින්නෙමු. මේ හේතුවෙන් නිවන යන්න නාම පදයක් ලෙස අපි යොදාගන්නෙමු. එහෙත් නිවන යනු නාමයක් හෝ සංකල්පයක් හෝ නො වෙයි.  නිවන් දැකීම, නිවන් අවබෝධය, නිවන් යෑම ආදී යෙදුම් අප යොදාගන්නේ සංසාර ගමන නැවැත්වීම යන්නට ය. ඒ අරුතින් ගත්කල එය ක්‍රියාවක් වෙයි. නිවන් අවබෝධය යනු අවශ්‍ය නම් ක්‍රියාවක් ලෙස සැලකිය හැකි ය. එහෙත් එසේ අවබෝධ කිරීමට නිවන යනුවෙන් දෙයක් නැත.

මනසක් ඇතැයි යනුවෙන් ගෙන අප කරන කියන දෑ නැතිකරන්නේ කිනම් අවස්ථාවක ද, එවිට අපට නිවන් අවබෝධවන්නේ යැයි කිව හැකි ය. එසේ කිව හැකි වුව ද එය වැරදි ය. ඒ වැරදි වන්නේ අපට නිවන් අවබෝධ නොවන බැවින් ය. නිවන් අවබෝධකරගන්නා පුද්ගලයකු සිටිය හැකි නො වෙයි. නිවන් අවබෝධයට පෙර ද සම්මුති වශයෙන් මිස පුද්ගලයකු නැත. එහෙත් නිවන් අවබෝධයට පෙර ඒ පුද්ගලයා තමන් පුද්ගලයකු ලෙස දකියි. තමන් ගැන සිතයි. තමන් යනුවෙන් පුද්ගලයකු ඇතැයි සිතයි. එහෙත් නිවන් අවබෝධවීමත් සමග තමන් යනුවෙන් නො

© Prof. Nalin De Silva

සිතයි. පිරිනිවන් පාන තෙක් ශරීරය සම්මුති වශයෙන් පවතින නමුත් මනස, නැති මනසක් බව නැති මනසින් “දැනගනියි ” . එසේ දැනගන්නේ කෙලෙස ද යන ප්‍රශ්නයට පිළිතුරක් දිය නොහැකි නමුත් නිවන් අවබෝධයෙන් පසු පුද්ගලයකු ලෙස සලකන්නේ එසේ සැලකීම වැරදි ලෙස ගනිමින් විය යුතු ය.

ගිනි බෝලයක් කරකවන විට එතැන ගිනි වලල්ලක් දකින ළමයකු එහි ඇත්තට ම ගිනි වළල්ලක් ඇතැයි සිතයි. එහෙත් වැඩිහිටියකු ඒ ගිනි වළල්ලක් ලෙස දකින නමුත් ගිනි වළල්ලක් නැති බව දනියි. නිවන් අවබෝධය හා අනවබෝධය අතර වෙනස එවැන්නක් යැයි මම නො කියමි. එයට හේතුව නිවන් අවබෝධයත් සමග ගිනි වළල්ල පමණක් නොව ගිනි බෝලය ද නැති බව “දැනගන්නා” නිසා ය. එහෙත් මේ “දැනගැනීම” පෘථග්ජනයන්ගේ දැනගැනීම සමග සමාන නොකළ යුතු ය. නිවන් අවබෝධයෙහි දී අනිත්‍ය දුක්ඛ අනාත්ම සංකල්පීය නොවන ආකාරයකින් අවබෝධවන්නේ යැයි සිතිය හැකි ය.

නිවන සංකල්පයක් නොවන නමුත් අපට නිවන ගැන කතාකිරීමට අවශ්‍ය බැවින් ඒ සඳහා වචනයක් ඇත. එය නාම පදයක් ලෙස පෙනී ගිය ද ඉන් පණ ඇති කිසිවකු හෝ පණ නැති යමක් හෝ නො හැඳින්වෙයි. එහෙත් බොහෝ දෙනා ඒ නාම පදයක් ලෙස ගෙන නිවන සංකල්පයක් ලෙස ගන්නා බව පෙනී යයි. නාගර්ජුනපාදයන් ද එවැනි වරදක් කර ඇති බව පැහැදිලි ය. උන්වහන්සේ සසරට සාපේක්ෂව නිවන ගැනීමෙන් ඒ වරද කළහ. අඳුරට සාපේක්ෂව එළිය ගැනීම නිවැරදි ය. අඳුර යන්නට අරුතක් ලැබෙන්නේ එහි විරුද්ධය වූ එළිය ගැන අපට හැඟීමක් ඇති බැවින් ය. පුටුව ගැන අවබෝධයක් ලැබෙන්නේ පුටුව නොවන්න යන්නෙන් කිනම් දෑ හැඳින්වෙන්නේ දැයි අප දන්නා බැවින් ය. එළිය, අඳුර, පුටුව ආදිය සංකල්ප වෙයි. ඒවා එක එකක් ඒ නොවන්න සමග සංසන්දනයකිරීමේ වරදක් නැත. එහෙත් ප්‍රශ්නය වනුයේ සංකල්පයක් වූ සසර, සංකල්පයක් නොවූ නිවන සමග සංසන්දනයකිරීමේ දී ය.

අනිත්‍ය යන්න සංකල්පයක් නොවුව ද බොහෝවිට ඒ වචනය සංකල්පයක් ලෙස ද අපි යොදාගන්නෙමු. ඒ නිත්‍ය යන්නෙහි විරුද්ධය ලෙස ය. එහි දී අනිත්‍ය යන්නට නිත්‍ය නොවන හෙවත් වෙනස්වීම යන අර්ථය ලැබෙයි. අනිත්‍ය ඒ අර්ථයෙන් සංකල්පයක් ලෙස ගත්කල නිත්‍ය යන සංකල්පය සමග සංසන්දනය කළ හැකි ය. අනිත්‍ය වෙනස්වීම යන අර්ථයෙන් ගත්කල අපට තේරුම්ගත හැකි ය. වෙනස්වීම යන්න තේරුම්ගත් පමණින් යමකුට නිවන් අවබෝධ නො වෙයි. අනිත්‍ය දුක්ඛ අනාත්ම යන්නෙහි අනිත්‍ය යන්න සංකල්පයක් නො වෙයි. එබැවින් අනිත්‍ය යන්න සංකල්පයක් ලෙසත් සංකල්පයක් නොවන ලෙසත් අවබෝධ කළහැකි වෙයි.

සංසාරය යන්න අප කාහටත් තේරෙන සංකල්පයකි. එබැවින් සංසාර ගමන නැවැත්වීම යන්න ද සංකල්පයක් වෙයි. සසර හා සසර ගමන නැවැත්වීම යන්න සංසන්දනය කළ හැකි විරුද්ධාර්ථ ගෙන දෙන සංකල්ප වෙයි. එහෙත් සසර ගමන නැවැත්වීම යන්න නිවන ලෙස ගැනීම ප්‍රශ්නයකි. එය අනිත්‍ය වෙනස්වීම ලෙස ගැනීම වැන්නකි. අනිත්‍ය සංකල්පයක් ලෙස ගතහොත් ඉන් වෙනස්වීම යන්න කියැවෙයි. එහෙත් සංකල්පයක් නොවන ලෙස ගැනීම යනු අනිත්‍ය දුක්ඛ අනාත්ම යන්නෙහි අනිත්‍ය වෙයි. නිවන සංකල්පයක් ලෙස නම් සසර ගමන නැවැත්වීම ය. එය අප කාහටත් අවබෝධ වෙයි. එහෙත් එපමණකින් අපට නිවන් අවබෝධ වන්නේ නැත. නිවන් අවබෝධවීම ගැන කියන විට නිවන ගැන සඳහන්වන්නේ සංකල්පයක් ලෙස නො වෙයි.

නිවන යනු සසර ගමන නැවැත්වීම යනුවෙන් සංකල්පයක් ලෙස තේරුම්ගන්නා නිවන හා නිවන් අවබෝධය යන්නෙහි සංකල්පයක් නොවූ නිවන එකක් ලෙස ගැනීම වරදක් වෙයි. මා දකින ආකාරයෙන් නාගර්ජුනපාදයන් වහන්සේ විසින් කෙරී ඇත්තේ මේ සංකල්පය හා සංකල්පය නොවන්න එකක් ලෙස ගැනීම ය. නිවන සසර ගමන නැවැත්වීම යන තේරුමෙන් සසරට සාපේක්ෂව ගෙන උන්වහන්සේ තම ප්‍රවාද ගොඩනගා ඇත. එහෙත් නිවන් අවබෝධය සසර ගමන නැවැත්වීම යන්න තේරුම්ගැනීම නොවන බව කාහට වුව ද වැටහිය යුතු වෙයි.

නාගර්ජුනපාදයන් වහන්සේ අතින් ඒ වරද සිදුවීමත් සමග උන්වහන්සේ සසරටත් නිවනටත් ඔබ්බෙන් වූ ශූන්‍යතාවක් නිර්මානය කළහ. නැත්නම් උන්වහන්සේට එසේ කිරීමට සිදුවිය. බුදුන් වහන්සේ ලෝකය අනිත්‍ය දුක්ඛ අනාත්ම ශූන්‍ය යැයි දෙසූ අවස්ථා පිළිබඳ ව අභාවප්‍රාප්ත මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාරත්න මහතා සඳහන්කර ඇත. ශූන්‍ය

© Prof. Nalin De Silva

යන්න ද අනාත්ම වැන්නක් ලෙස ගැනීම එහි දී සිදුවෙයි. එයද සංකල්පයක් නො වෙයි. එහෙත් ශූන්‍යතාව යන්න එසේ නො වෙයි. ඒ සංකල්පයක් බවට ද පත්වෙයි.

ශූන්‍යතාව සංකල්පයක් ලෙස ගත්විට ඒ පවතින්නක් බවට පත්වෙයි. සියළු සංකල්ප සාපේක්ෂ බව නැවත නැවතත් අවධාරණය කළ යුතු ය. නාගර්ජුනපාදයන් වහන්සේ සංකල්පවල සාපේක්ෂතාව සම්බන්ධයෙන් දක්වන අදහස්වල ගැටළුවක් නැත. එහෙත් ප්‍රශ්න වනුයේ සසරට සාපේක්ෂව සංකල්පයක් නොවූ නිවන ගැනීම හා ශූන්‍යතාව යන්න නිර්මාණය කිරීම ය. එක් අතකින් ගත්කල උන්වහන්සේ ශූන්‍යතාව සංකල්පයක් ලෙස ගත්තේ ද යන්න ද පැහැදිලි නැතැයි යමකුට කිවහැකි ය. ශූන්‍යතාව සංකල්පයක් නොවේ යැයි තර්කකිරීමට ද යමකුට ඉඩකඩ ඇත.

එයට එක් ප්‍රධාන හේතුවක් වනුයේ ශූන්‍යතාව වෙනත් කිසිවකට සාපේක්ෂව ඉදිරිපත්කර නො තිබීම ය. සසරට සාපේක්ෂව නිවන ඉදිරිපත්කළ ආකාරයට ශූන්‍යතාව ඉදිරිපත්කෙරී නැත. මෙහි දී සඳහන්වන්නේ ද සංකල්පීය ශූන්‍යතාව ගැන බැවින් ශූන්‍යතාව සංකල්පයක් නො වේ යැයි යනුවෙන් ද යමකුට තර්කකිරීමට හැකි ය. ශූන්‍යතාව සංකල්පයක් නොවේ නම් ඒ නාගර්ජුනපාදයන් වහන්සේගේ පද්ධතියෙහි ඇති සංකල්පයක් නොවන්න විය යුතු ය. සංකල්පවල ශූන්‍යතාව තවත් සංකල්පයක් වන්නේ කෙසේ ද යන්න නම් ප්‍රශ්නයක් වෙයි. ශූන්‍යතාව සංකල්පයක් නම් ඒ මනසින් අවබෝධකරගත හැකිවිය යුතු ය. අනෙක් අතට ඒ සංකල්පයක් නොවන්නේ නම් ඒ අවබෝධකරගන්නේ කෙසේ ද යන ප්‍රශ්නය වෙයි. අප මෙය තවදුරටත් සාකච්ඡා කළ යුතු වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva